# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1901/3 - 2015 පෙබරවාරි මස 10 වැනි අඟහරුවාදා - 2015.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

රේගු ආඥාපනත (235 වන අධිකාරය)

**2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ "ඉ" උපලේඛනයේ 10 වන වගන්තිය යටතේ නියෝගය**

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ "ඉ" උපලේඛනයේ අංක 10 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රවී කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් අංක 87.01, 87.02, 87.03, 87.04, 87.05 සහ 87.11 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ වර්ගීකරණය වන ආනයනය කරනු ලබන මෝටර් වාහන සඳහා තීරු බදු සහ අනෙකුත් සියලු බදු හා ගාස්තු අයකිරීම සඳහා වටිනාකම (මිළ) නියම කිරීම වර්ෂ 2015 පෙබරවාරි මස 10 වැනි දින සිට අවුරුදු දෙකක කාලයක් බලපවත්වන පරිදි පහත සඳහන් ලෙස සිදු කළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

*මෝටර් වාහන සඳහා වටිනාකම (මිළ) ගණනය කිරීම*

සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 87.01, 87.02, 87.03, 87.04, 87.05 සහ 87.11 යටතට වැටෙන මෝටර් වාහන සඳහා රේගු වටිනාකම (මිළ) පහත සඳහන් අයිතමයන් 1, 2, 3, 4 සහ 5 හි එකතුව වන පරිදි ගණනය කළ යුතුය.

(1) පහත (i) හා (ii) හි සඳහන් අගයන්ගෙන් වැඩි අගය –

(i) නිෂ්පාදකයා විසින් ප්‍රකාශිත ගනුදෙනු කිරීමේ වටිනාකම පදනම් කරගෙන, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන වටිනාකම ;

(ii) වාහනය ශ්‍රී ලංකාවේ වරායට පැමිණෙන තෙක් සත්‍ය ලෙසම ගනුදෙනු කළ FOB (නැව තෙක් නොමිලේ මිළ) වටිනාකම, මෙයට දේශීයව සිදුකරන ලද සෑම ආකාරයකම වූ ගනුදෙනු ද ඇතුළත්ය.

(2) ශ්‍රී ලංකාවේ වරාය දක්වා ප්‍රවාහන ගාස්තු,

(3) ශ්‍රී ලංකාවේ වරාය දක්වා රක්ෂණ වාරිකය,

(4) ශ්‍රී ලංකාවේ වරාය දක්වා ප්‍රවාහනය කිරීමට අදාළ පැටවීම, බෑම සහ අදාළ මෙහෙයුම් ගාස්තු,

(5) මිලදී ගනු ලබන තැනැත්තා විසින් වාහනය ශ්‍රී ලංකාවේ වරායට පැමිණෙන තෙක් දරනු ලබන විකුණුම් කොමිස් හා තැරැව්කාර ගාස්තු

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ "ඉ" උපලේඛනයේ 10 වගන්තිය යටතේ වර්ෂ 2015 ජනවාරි මස 29 වැනි දින පළ කරනු ලද අංක 1899/35 දරන ගැසට් නිවේදනය මෙයින් අවලංගු කරමි.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 පෙබරවාරි මස 10 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01.

02 - 743


1A - PG 2366 — 505 (2015/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*